中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL

# සුහාසර්

蓮花

沈鸣

තෙවන කාණ්ඩය - දෙවන කලාපය




## එක් තීරයක් එක් මාවතක් තුළින් ගොඩනැගෙන කර්මාන්ත පුර සහයෝගතාව
පිටුව 6

## සැලැසුම්කරුවා සහ සාර්ථක මිනිසා
පිටුව 15

## චීන ගැටය
පිටුව 21

## චොංශෑන් විශ්ව විද්‍යාලය
පිටුව 26

## ඇස් දෙක ලස්සණට තබා ගමු
පිටුව 37


中国国际广播电台和斯里兰卡红十字协会联合出版




# චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය

චීනය සහ ජාත්‍යන්තර ප්‍රජාව එකට එක් කරමින් චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය ආරම්භ කෙරුණේ 1941 දෙසැම්බර් මස 3 වැනි දාය. අද වන විට එය ලොව පුරා වැඩිම භාෂා ගණනාවක් විකාශනය කරන විශාලතම ගුවන් විදුලි ජාලයක් බවට පත්ව තිබේ. එයින් ලොව පුරා විකාශනය කෙරෙන භාෂා ගණන මේ වන විට 65කි. ලෝකයේ සංනිවේදන විධික්‍රම වඩාත් පුළුල් වීමත් සමඟ අන්තර්ජාල රූප මාධ්‍ය හා ජංගම දුරකථන සහ පොඩ්කාස්ටින් වැනි නූතන බහුවිධ මාධ්‍ය ඔස්සේ සිය විකාශන ජාලය ශක්තිමත් කිරීමට චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය පියවර ගත්තේය.

ඒ අනුව වසර 2011 ජනවාරි 18 වනදා CIBN චීන අන්තර්ජාතික ගුවන්විදුලි විකාශන ජාලය ආරම්භ කෙරිණ. ලොවපුරා ප්‍රවෘත්ති ඒජන්සි මධ්‍යස්ථාන 8ක් පවතින අතර රටවල් 32ක ප්‍රවෘත්ති වාර්තාකරණ ඒජන්සි ආයතන පිහිටුවා තිබේ. ලොව පුරා විසිරුණු කොන්ෆියුසියස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ අසන්නන්ගේ සමාජ 4114ක් ලොව පුරා ක්‍රියාත්මකය.

සුභාසර 蓮花


**චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය**

**SINHALA SERVICE**

**CHINA RADIO INTERNATIONAL**



No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040

00 86 10 6889 2373/0439

00 86 10 68892361

sinhalacri@gmail.com

http://sinhalese.cri.cn/

Cheena Sinhala handa

Voice of China-Lanka



**අනුශාසකත්වය**

ජගත් අබේසිංහ

සුදත් මඩුගල්ල

**සංස්කාරක**

ෂාඕ ජී යං

**කතෘ මඩුල්ල**

ශී යුයැ, ෂෞං ලී, ලියු හුයි, ෂාඕ ජී යං,
හාඕ ලී ෆාං, වං යිං, හැන් ජියැන්,
සුන් ජියා ජියා, බූ යුන්, චෙන් ගුවැන් වන්,
රවිමල් හඳුවල, සුගත් රත්නායක



**ප්‍රකාශනය**

චීන ජාත්‍යන්තර ගුවන් විදුලිය සහ
ශ්‍රී ලංකා රතු කුරුස සමාජය


# පටුන


චීනයට ඓතිහාසික අයිතිය හිමි දකුණු චීන මුහුදේ දූපත් 2

එක් තීරයක් එක් මාවතක් තුළින් ගොඩනැගෙන කර්මාන්ත පුර සහයෝගතාව 6

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ප්‍රථම ජාත්‍යන්තර ආධාරය චීනයෙන් 9

චීන බෞද්ධ සංගමයේ උප සභාපති මින් ෂන් ස්වාමින් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය 9

චීන ජාතික ක්‍රීඩාංගනය - කුරුළු කූඩුව 10

චීන ජාතික පිහිනුම් මධ්‍යස්ථානය - ජල ඝනකය 13

සැලැසුම්කරුවා සහ සාර්ථක මිනිසා 15

කඳු සමතලා කළ අධිෂ්ඨානය 16

ළමා සාහිත්‍යයේ නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලද චීන ලේඛකයා 18

චීන ගැටය 21

එදිනෙදා චීන බස 24

චොංශෑන් විශ්ව විද්‍යාලය 26

චීන තරුණයා “හැන් හැන්” 28

මනස්කාන්ත ෂින් අන් ච්‍යං ගංගාව 31

අසන්නන්ගේ බිත්ති පුවරුව 34

තෙල්වලින් බැදපු බෝංචි ව්‍යංජනය 36

ඇස් දෙක ලස්සණට තබා ගමු 37

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයෙන් 39

# චීනයට ඓතිහාසික අයිතිය හිමි

# දකුණු චීන මුහුදේ දූපත්



දකුණු චීන මුහුදු ප්‍රදේශ වල ජාත්‍යන්තර නෞකා යාත්‍රා කිරීමේ සීමාවන් චීනය විසින් පනවා ඇතැයි ඇමෙරිකාව චෝදනා කල ද එය සත්‍ය නෙමෙයි. ඒ පිළිබඳව සිංගප්පූරුවේ ප්‍රධාන පෙලේ පුවත්පතක හිටපු කතුවරයෙකු අදහස් පළ කළේ දකුණු චීන මුහුදු ගැටළුවට මැදිහත් වීමට ඇමෙරිකාවට කිසිදු අයිතියක් නොමැති බවයි. සිංගප්පූරුවේ ද ස්ට්‍රේට් ටයිම් පුවත්පතේ හිටපු ප්‍රධාන කර්තෘ ෆුන් යුවන්ලියාන් මහතා පැවසුවේ ඇමෙරිකාව දකුණු චීන මුහුදු ගැටළුව ඇවිලීමට කටයුතු කරමින් සිටින බවයි. යම් හෙයකින් චීනය හා ඇමෙරිකාව අතර නොසන්සුනාවක් ඇති වුවහොත් එය වෙනත් රටවලට බලපෑ හැකි බව ඔහු පෙන්වා දුන්නේ ය. දකුණු චීන මුහුදු ගැටළුවේදී ඇමෙරිකාව වැරදි ස්ථාවරයක සිටින බව ඕනෑ ම බුද්ධිමත් අයෙකුට වැටහෙන බව ඔහු සඳහන් කළේ ය. දකුණු චීන මුහුදේ ජාත්‍යන්තර නෞකා වලට කිසිදු බාධාවකින් තොරව යාත්‍රා කිරීමට හැකි බව පෙන්වා දෙන ඔහු ඊට චීනය බාධා කළ අවස්ථා කිසිවක් ඇත් නම් ඒවා පෙන්වා දෙන්නැයි ඇමෙරිකාවට අභියෝග කර සිටී.

වසර 2000කට වැඩි ඉතිහාසය තුළ චීනයට දකුණු චීන මුහුදේ දූපත් රැසක හිමිකම තිබේ. එහි දූපත් රැසක් මුලින් ම සොයා ගෙන නම් කළේ චීනයයි. දකුණු චීන මුහුදේ දූපත්වල ස්වාධිපත්‍ය අයිතිය ප්‍රකාශයට පත් කළ පළමු වැනි රට චීනයයි. දෙවැනි ලෝක යුද්ධයේදී ජපානය සහ ප්‍රංශය දකුණු චීන මුහුදේ දූපත් රැසක් අක්‍රමණය කළේ ය. වසර 1946යේ චීන ආණ්ඩුව දකුණු චීන මුහුදේ දූපත් රැසක් යළිත් අයිති කර ගැනීමට සමත් විය. එදා සිට චීනය එහි ස්මාරක තනමින් හමුදා කඳවුර ද ස්ථාපිත කර තිබේ.

දකුණු චීන මුහුදේ දූපත් වල පිහිටීම අනුව චීනය විසින් ප්‍රධාන කොටස් හතරක් නම් කර තිබේ. ඒ තමයි නැන්ෂා, ෂීෂා, චුංෂා සහ තුංෂා යන කොටස් හතර ය. පිලිපීනය පසුගිය සියවසේ හතලිහ





ඉදිරිපත් කිරීම : ශී යුයැ



හා පනහ දශකවල සිට ම චීනයේ නැන්ෂා දූපත් ඉලක්ක කර ගනිමින් රහසිගත ක්‍රියා සිදු කළේ ය. එහි දූපත් අටක ස්වාධිපත්‍යය හිමි බවට පිලිපීනය පසුගිය හැත්තෑව දශකයේදී ප්‍රකාශයට පත් කළේ ය. වසර 1978 එරට ජනාධිපති නියෝගයක් ප්‍රකාශයට පත් කර චීනයට අයත් දකුණු චීන මුහුදේ දූපත් කිහිපයක් අලුතින් නම් කර එහි ස්වාධිපත්‍යය තමන්ට හිමි බව පිලිපීනය ප්‍රකාශ කළේ ය. ඒ දූපත් කිහිපය කිසිදු රටකට අයත් නොවන බවත් ඉතිහාස සබඳතා හා වර්තමාන අවශ්‍යතාව සලසා ජාත්‍යන්තර නීතියට අනුව, එම දූපත් අපේ අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කරන බවත් පිලිපීනය සඳහන් කළේ ය. එම නීති විරෝධි ක්‍රියාවෙන් පිලිපීනය හරියටම ඔප්පු කළේ මීට පෙර එම දූපත් තමන්ට අයත් නොවූ බවයි. තමන්ට අයිති දේ අලුතින් ප්‍රකාශ කරන්න අවශ්‍ය නෑ නේ ද?

කවර බේරුම්කරණ තීන්දුවකටවත් චීනයේ දකුණු චීන මුහුදු දූපත් සහ ඒ අවට ජල තීරයේ ස්වාධිපත්‍ය අයිතිය පිළිබඳ සත්‍යය යටපත් කළ නොහැකිය. පිලිපීනයේ ඒකපාර්ශවික බේරුම්කරණයට මැදිහත් නොවී චීනය ජාත්‍යන්තර නීතියේ උත්තරීත්වය හා එක්සත් ජාතීන්ගේ සාගර නීති ප්‍රඥප්තිය අනුව ක්‍රියා කරන බව චීන රජය ප්‍රකාශ කර තිබේ.

දකුණු චීන මුහුද පිළිබඳ චීන-පිලිපීන මතභේදයට



හේතුව පිලිපීනය විසින් එම මුහුදු ප්‍රදේශයේ දූපත් හා නැන්ෂා දූපත් වල කොරල් පර නීතිවිරෝධීව අත්පත් කර ගැනීම සහ දෙරටක සාගර සීමා අර්ථ නිරූපනය බව චීන විදේශ අමාත්‍යංශයේ දේශ සීමා සාගර කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේ ය.

පිලිපීනය ඒකපාර්ශවික බේරුම්කරණය ඉදිරිපත් කළේ චීනයට කිසිදු ආකාරයෙන් දැනුවත් කිරීමකින් හෝ සාකච්ඡා කිරීමකින් තොරව බව චීන විදේශ අමාත්‍යංශ ප්‍රකාශිකා හුවා චුන් යීං මහත්මිය ප්‍රකාශ කර තිබේ.

සාකච්ඡාව හරහා දකුණු චීන මුහුදු මතභේද විසඳා ගැනීම චීනයේ ස්ථිර ස්ථාවරත්වයයි. එය දකුණු චීන මුහුද පිළිබඳ විවිධ පාර්ශ්වයන්ගේ මාර්ගෝපදේශ සංග්‍රහයේ පැහැදිලිව සඳහන් කර තිබේ. ඒකපාර්ශවික බේරුම්කරණය එම සංග්‍රහය උල්ලංඝනය කරන අතර මතභේද විසඳා ගත නො හැකි බව චීන විදේශ අමාත්‍යංශ ප්‍රකාශිකා හුවා චුන් යීං මහත්මිය සඳහන් කරයි. කෙසේ වෙතත් දකුණු චීන මුහුදු ගැටළුව සම්බන්ධයෙන් ජගත් ප්‍රජාව සත්‍ය තත්වය ගරු කරමින් පිළි ගනු ඇතැයි චීනය අපේක්ෂා කරයි.







# එක් තීරයක් එක් මාවතක් තුළින් ගොඩනැගෙන කර්මාන්ත පුර සහයෝගතාව

ඒක් තීරයක් එක් මාවතක් යනු සේද මාවතේ ආර්ථික තීරය හා 21වන සියවසේ මුහුදු සේද මාවතට යෙදෙන කෙටි යෙදුමකි. එය චීනය හා අදාළ රටවල් අතර ද්විපාර්ශ්වික හෝ බහු පාර්ශ්වික ක්‍රමවේදය ප්‍රයෝජන ගැනීමෙන් ක්‍රියාත්මක කරන චීන ජාතික උසස් මට්ටමේ උපාය මාර්ගයකි. එක් තීරයක් එක් මාවතක් ගොඩනැගීම මගින් අදාළ රටවල් එක්ව සංවර්ධනය කිරීම, අන්‍යෝන්‍ය විශ්වාසය මෙන්ම හුවමාරු ශක්තිමත් කිරීම හා ප්‍රාදේශීය සංවර්ධනය ළඟා කර ගත හැකි ය.

එක් තීරයක් එක් මාවතක් ගොඩනැගීම ආරම්භ වීමෙන් පසු චීනය හා අදාළ රටවල් අතර ව්‍යාපෘති දහස් ගණනක් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරින් කර්මාන්ත පුර සහයෝගතාව කැපී පෙනේ. කාර්මික පුර, කෘෂිකාර්මික, පේෂ කර්මාන්ත පුර ඇතුළු චීනය හා ටජිකිස්ථානය අතර කර්මාන්ත පුර සහයෝගතාව එක් තීරයක් එක් මාවතක් ගොඩනැගීමේදී වැදගත් ව්‍යාපෘතියකි.

2014 වසරේ අප්‍රේල් මස 4 වනදා ටජිකිස්ථානයේ උතුරු ප්‍රදේශයේ සොඩර්ග් ප්‍රාන්තයේ චීන හා ටජිකිස්ථාන කාර්මික පුර පදනම් කර ගැනීමේ උත්සවය පැවැත්විණ. චීන හා ටජිකිස්ථාන කාර්මික පුරේ ප්‍රධාන ආයෝජන පාර්ශ්වය වූය් ටජිකිස්ථාන හා චීන පතල් කර්මාන්ත සමාගම ය. ටජිකිස්ථානයේ දෙවන විශාලතම කාර්මික සමාගම වන ටජිකිස්ථාන හා චීන පතල් කර්මාන්ත සමාගම අඛණ්ඩව ටජිකිස්ථානයේ ඊයම් හා සින්ක් කැණීම්වලට ඇමෙරිකානු ඩොලර් දස කෝටියක මුදලක් ආයෝජන කර තිබේ. ඉන් එක් ඊයම් හා සින්ක් ව්‍යාපෘතියක වටිනාකම චීන යුවාන් බිලියන 100කි. එය චීන සමාගම මැද ආසියාවේ ලබා ගන්නා උපාය මාර්ගික හා ආර්ථික අර්ථය සහිත හොඳම පතල් සම්පත්වලින් එකකි. වාර්තා වලට අනුව චීන හා ටජිකිස්ථාන කාර්මික පුර තුළ ඊයම් හා සින්ක් ලෝහ උණුසුම් කිරීමේ කර්මාන්ත ශාලාවක්, සිමෙන්ති කර්මාන්ත ශාලාවක් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීමට සැලසුමක් ඇත. එහි සමස්ත ආයෝජන සංඛ්‍යාව ඇමෙරිකානු ඩොලර් දස කෝටි 5කි. 2017 වසරේ එම කර්මාන්ත ශාලා ස්ථාපනය කිරීමෙන් පසු ටජිකිස්ථාන ජනතාවට

රැකියා 2500ක් ලැබිය හැකිය.

කාර්මික පුර ස්ථාපනය කිරීමෙන් පසු දෙරටේ කර්මාන්ත පුර සහයෝගතාවේදී නව ව්‍යාපෘතිය ආරම්භ වීමට උත්සාහ දරා තිබේ. 2014 වසරේ දෙසැම්බර් මස 19 වනදා ෂොංග් ටායි ටජිකිස්ථාන කෘෂිකාර්මික පේෂ කර්මාන්ත පුර පදනම් කර ගැනීමේ උත්සවය ටජිකිස්ථානයේ දකුණු ප්‍රදේශයේ දන්ගරාහිදි හි පැවැත්විණ. එම කෘෂිකාර්මික පේෂ කර්මාන්ත පුරය චීන ශිං ච්‍යාං ස්වායත්තයේ ෂොංග් ටායි සමාගම විසින් ආයෝජන කළ ජාත්‍යන්තර මට්ටමේ නවීකරණ පේෂ කර්මාන්ත පුරයකි. කපු කුඹුරු අක්කර ලක්ෂ දෙකක කෘෂිකාර්මික පුර හා පේෂ කර්මාන්ත කුටි ලක්ෂ 1.5ක් ඊට ඇතුළත් වෙයි. 2015 වසරේ ප්‍රථම වරට අක්කර ලක්ෂ 1.5ක කපු වගා කර තිබේ. 2016 වසරේ පේෂ කර්මාන්ත ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම ආරම්භ විය.

ෂොංග් ටායි ටජිකිස්ථාන කෘෂිකාර්මික පේෂ කර්මාන්ත පුර ටජිකිස්ථාන ජාතික වැදගත් ව්‍යාපෘති ලැයිස්තුව මෙන්ම චීන හා ටජිකිස්ථාන සහයෝගතාවල වැදගත් ව්‍යාපෘති ලැයිස්තුවට නම් කර තිබේ. එම කෘෂිකාර්මික පේෂ කර්මාන්ත පුර සම්පූර්ණයෙන්ම ස්ථාපනය කිරීමෙන් පසු ඇට වෙන් නොකළ කපු ටොන් අසූ දහසක්, ඇට ඉවත් කළ කපු ටොන් තිස් දෙ දහසක්, කපු රෙදි ටොන් විසි හාර දහසක් හා කපු පිළි මීටර් මිලියන 91.5ක් ඒ වාර්ෂික නිෂ්පාදනය බවට පත් විය හැකි ය. එහි වාර්ෂික ආදායම චීන යුවාන් බිලියන 1.5කි. එහි වාර්ෂික ලාභය චීන යුවාන් දස කෝටි 2.5කි. ඉන් ටජිකිස්ථාන කෘෂිකාර්මික වගා කිරීමේ ව්‍යුහය අලුත්වැඩියා කිරීම, කාර්මික සංවර්ධනය කිරීම, රැකියා නියුක්තිය ඉදිරියට ගෙන යාම හා ටජිකිස්ථාන ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම සාක්ෂාත් කළ හැකි ය.

ෂොංග් ටායි ටජිකිස්ථාන කෘෂිකාර්මික පේෂ කර්මාන්ත පුර පදනම් කර ගැනීමේ උත්සවයේදී ටජිකිස්ථාන ජනාධිපති එමොමාලි රක්මොන් මහතා ප්‍රකාශ කළේ ව්‍යාපාරිකයන්ගේ ආයෝජනයට







ටජිකිස්ථාන රජය අඛණ්ඩව සහය ලබා දෙන බවයි. හොඳ ආයෝජන සඳහා පරිසරය හා වේදිකාව සපයන බව ටජිකිස්ථාන රජය කැමැත්ත දක්වන බව හෙතෙම කියා සිටියේය. ෂොංග් ටායි ටජිකිස්ථාන කෘෂිකාර්මික පේෂ කර්මාන්ත පුර ව්‍යාපෘතියෙන් ලෝකයේ හොඳම යන්ත්‍ර හා දක්ෂයින් පමණක් නොව බොහෝ රැකියා අවස්ථා ටජිකිස්ථානය ලබා ගෙන තිබේ.

චීන හා ටජිකිස්ථාන ආර්ථික හා වෙළඳ සංවර්ධනය එකිනෙකාට පරිපූරක වෙයි. කර්මාන්ත පුර සහයෝගතාව මගින් දෙරටේ සිය වාසි එකි-නෙකාට උපාකාරී විය හැකිය. එය කර්මාන්ත පුර සහයෝගතාව කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණයකි. ඉදිරියේ එක් තීරයක් එක් මාවතක් ගොඩනැගීමේදී මේ වැනි ආදර්ශනය අඛණ්ඩව මතු වෙයි. එක් තීරයක් එක් මාවතක් ගොඩනැගීම මගින් අදාළ රටවල් හා ජනතාවට ප්‍රයෝජන රැසක් හිමිවන්නේ මේ නිසාය.







ඉදිරිපත් කිරීම : වෙන් ගුවැන් වන්



# ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ප්‍රථම ජාත්‍යන්තර ආධාරය චීනයෙන්



චීන රතු කුරුස සමාජය විසින් පසුගියදා ගංවතුරින් විපතට පත්වූවන්ට විශේෂ ආධාරයක් චීන තානාපති කාර්යාලය මගින් සිදු කරන ලදී.

එහිදී චීන තානාපති කාර්යාලයේ නියෝජ්‍ය තානාපති පාන් චුන්ෂිවේ මැතිනිය විසින් ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සුදත් මඩුගල්ලේ මහතා වෙත භාර දුන් අවස්ථාව

# චීන බෞද්ධ සංගමයේ උප සභාපති මින් ෂන් ස්වාමින් වහන්සේගේ ශ්‍රී ලංකා සංචාරය



ශ්‍රී ලංකා චීන බෞද්ධ මිත්‍රත්ව සංගමය සංවිධානය කරන ලද ශ්‍රී ලංකා චීන ඓතිහාසික බෞද්ධ සංස්කෘතික සබඳතා මැයෙන් සම්මන්ත්‍රණයක් පසුගියදා කොළඹදී පැවැත්විය.

මෙහිදී ප්‍රධාන අමුත්තා ලෙස පැමිණි ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටුයතු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා චීන බෞද්ධ සංගමයේ උප සභාපති මින් ෂන් ස්වාමින් වහන්සේට විශේෂ තිළිණයක් පිරිනැමූ අවස්ථාව.



චීන දූත පිරිස ගරු කථානායක කරූ ජයසූරිය මැතිතුමා කථානායක නිල නිවසේදී හමුවූ අවස්ථාව

# චීන ජාතික ක්‍රීඩාංගනය

# කුරුළු කූඩුව

එසර 2008ටේ බේයිජිං ඔලිම්පික් ක්‍රීඩා උළෙල සාර්ථක ලෙස පැවැත්විණ. ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ විශාලතම ව්‍යාපෘතිය ලෙසට ක්‍රීඩාංගන සකස් කිරීම හඳුන්විය හැකි ය. මෙම ක්‍රීඩාංගන අතර වඩාත් ආකර්ෂණීය ආකෘතියක් බවට පත් ව තිබෙන චීන ජාතික ක්‍රීඩාංගනය කැපී පෙනේ. එය ලොව අසිරිමත් ක්‍රීඩාංගනයකි.

චීන ජාතික ක්‍රීඩාංගනය පිහිටා තිබෙන්නේ උතුරු බේයිජිං නගරයේ ඔලිම්පික් උද්‍යාන කලාපයේදී ය. කුරුළු කූඩුවක හැඩය ගත් එහි සමස්ත වපසරිය වර්ග මීටර දෙලක්ෂ පනස් අට දහසකි. ප්‍රේක්ෂකයන් 91 දහසකට එහි තරග නැරඹිය හැකි ය.





මෙම අපූරු ක්‍රීඩාංගනයේ ඉදි කිරීම ආරම්භ කෙරුණේ 2003 වසරේ දෙසැම්බර් මාසයේදී ය. එවගේම 2008 වසරේ මාර්තු මාසයේ අවසන් විණ. එයට යුආන් බිලියන 2.26ක් ආයෝජනය කෙරිණ. මේ ජාතික ක්‍රීඩාංගනය සමාරම්භක උළෙල, පරිසමාප්ත උළෙල මෙන්ම මලල ක්‍රීඩා සහ පාපන්දු තරග ඉසව් වෙනුවෙන් භාවිත කෙරිණ. ඔලිම්පික් ක්‍රීඩා උළෙලට පසු එය බෙයිජිං වැසියන්ගේ විශාල පරිමාණයේ ක්‍රීඩා විනෝදාංශ ස්ථානයක් බවට පත් වී තිබේ. එවගේම එය බෙයිජිං නගරයේ සංකේතවත් ගොඩනැගිල්ලක් හා ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ උරුමයක් බවට පත් වී තිබේ.









ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං



# චීන ජාතික පිහිනුම් මධ්‍යස්ථානය
# ජල ඝනකය

චීන ජාතික පිහිනුම් මධ්‍යස්ථානය වන ජල ඝනකය වසර 2008දී බේයිජිං ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ සහ පැරාඔලිම්පික් ක්‍රීඩා උළෙලේ පිහිනුම් තරඟ ස්ථානයයි.

ජල ඝනකය වසර 2003දී ඉදි කිරීම ආරම්භ විණ. එය වසර 2007දී අග භාගයේ අවසන් විය.

ජල ඝනකයේ බාහිර කොටස සෛල ආකාරයට හා සබන් බුබුලුවල ස්වාභාවික පෙනුම අනුව නිර්මාණය කෙරිණ. මේ ජල ඝනකයේ සමස්ත රාමුවට ඇතුලත් වෙන්නේ වානේ ව්‍යුහ හා පාරදෘෂ්‍ය වායු කොට්ටයි. එයට වැඩිපුර ස්වාභාවික ආලෝක එකතු කළ හැකි ය. වායු කොට්ටවලට දිගු කාලයක් ස්ථිර ලෙස පැවතිය හැකි ය. එමෙන්ම එය ගිනි හා භූමි කම්පනවලට ද ඔරොත්තු දෙයි.






එම ව්‍යුහය පෙර නොවූ විරූ විශේෂ ව්‍යුහ වර්ගයකි.

ජල ඝනකයේ ප්‍රේක්ෂක ආසන 6000කි. එහි සමස්ත භූමි ප්‍රමාණය වර්ග මීටර් 80දහසකි. බේයිජිං ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වූ කාලයේ පිහිනුම්, කිමිදුම්, සමකාලික පිහිනුම් හා ජල පෝලෝ ක්‍රීඩාව යනාදි තරග ඉසව් ජල ඝනකයේ පැවැත්විණ.

ඔලිම්පික් ක්‍රීඩා උළෙලට පසුව එම මධ්‍යස්ථානය, පිහිනුම්, ක්‍රීඩා, ශාරීරික ව්‍යායාම සහ විනෝදාංශ යනාදිය එකතු කරන බහු ක්‍රියාකාරිත්ව මධ්‍යස්ථානයකි. හැම වසරකම එහි චීන සංචාරකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ 22කට අධිකයි.

වසර 2015හේ බේයිජිං නගරයට වසර 2022කේ සීත කාලීන ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වීමේ වරම හිමි විය. ඒ හේතුවෙන් ඉන් පසු ජල ඝනකය අයිස් ඉසව් පැවැත්වෙන ස්ථානයක් වශයෙන් පත් කිරීමට ක්‍රියා කෙරේ. ඒ අනුව "ජල ඝනකය" "අයිස් ඝනකය" බවට පත් වනු ඇත.

ඉදිරි වසර කිහිපය තුළ එම ශාලාව අයිස් තරග ස්ථානය සහ ජල තරග ස්ථානයක් වශයෙන් වෙනස් වීම සැබෑ වෙනු ඇත. ඉන් පසු එම මධ්‍යස්ථානයේ තරග ශාලාවට වඩා සරුසාර සංයුක්ත සේවා හැකියාවන් හිමි වෙයි.





ඉදිරිපත් කිරීම : හාඕ ලී ෆාං

# සැලැසුම්කරුවා සහ සාර්ථක මිනිසා



එක්සත් ජනපද සමීක්ෂණ සමාගමක් පසුගිය දා විවිධ ක්ෂේත්‍රයන්හි ඉදිරියෙන් සිටින සාර්ථක පුද්ගලයන් දහසක් පමණ සමීක්ෂණයකට භාජනය කළේ ය.

නමුත් සමීක්ෂණයට ලක් වූ පිරිසෙන් සියයට අනූනවයකට ම තමන් සාර්ථකත්වය ලබා ගැනීමට හේතු කුමක් දැයි කියන්නට නොහැකි විය. එපමණක් නොව, සාර්ථකත්වය ලබා ගැනීම වෙනුවෙන් එම පිරිස ක්‍රමානුකූල ව සැලැසුම් නොකළ බවත් සමීක්ෂණයෙන් හෙළි වී තිබේ.

ඔවුන් සාර්ථක වූයේ එක්කෝ ඉවෙන් නිවැරදි දිශාවක් කරා ගමන් ගත් නිසා, නැත්නම් මහන්සියෙන් කටයුතු කළ නිසා, නැත්නම් පුද්ගලික රුචිකත්වයට දැඩි ලෙස නැඹුරු වූ නිසා, එසේ නොමැති නම් සාර්ථකත්වය ලබා ගැනීමේ චේතනාවෙන් කිසි විටක ඉවත් නොවූ නිසා ය.

එම සමීක්ෂණ සමාගම තවත් කටයුත්තක් සිදු කළේ ය. ඒ සාර්ථකත්වය හිමි කර ගැනීමට සම්පූර්ණ සැලැසුම් දහසක් මහජනතාවගෙන් කැඳවා ගැනීම ය.

ශ්‍රේෂ්ඨ විද්‍යාඥයෙක් හෝ ලේඛකයෙක් හෝ වන්නේ කෙසේ ද , සාර්ථක ව්‍යවසායකයෙක් හෝ ව්‍යාපාරිකයෙක් හෝ වන්නේ කෙසේ ද සහ සුපිරි ක්‍රීඩකයෙක් හෝ නළුවෙක් හෝ වන්නේ කෙසේ ද යන්න එම සැලැසුම් අතර විය.

අවසානයේ හොඳ ම සැලැසුම් දහසක් තෝරා ගැනිණ. එම හොඳ ම සැලැසුම්වල සාර්ථකත්වය හිමි කර ගැනීමට හැම පැයක ම කළ යුතු දේ වුව ද සඳහන් වී තිබිණ.

යම් කටයුත්තක් සාර්ථක කර ගැනීමට මූලික වශයෙන් අවශ්‍ය දේ ද එහි පෙන්වා දී තිබේ. ඇත්ත වශයෙන්, එම සැලැසුම් අනුව තමාගේ සිහිනයක් සාර්ථක කර ගැනීම අනිවාර්යයි කියන හැඟීම් කෙනෙකුට ඇති විය හැකි ය.

ඉන් අනතුරුව , එම හොඳ ම සැලැසුම් දහස ඉදිරිපත් කළ පුද්ගලයන් පිළිබඳ සොයා බැලීමක් සිදු කෙරිණ.

එම පුද්ගලයන් සැබෑ ජීවිතයේ දී අසාර්ථක පුද්ගලයන් හෝ සාර්ථකත්වය කරා ගමන් කරමින් සිටින පුද්ගලයන් බව හෝ පසුව දැන ගන්නට ලැබිණ.

හොඳ සැලැසුම් අතේ තිබෙන පුද්ගලයන්ට සාර්ථකත්වය හිමි කර ගන්නට නොහැකි වී තිබේ. නමුත් , හොඳට සැලැසුම් නොකළ පුද්ගලයන්ට සාර්ථක වෙන්නට හැකි වී ඇත.

මේ දෙපිරිස අතර තිබෙන වෙනස කුමක් ද ?

ජීවිතය සාර්ථක කර ගන්නේ වචනයෙන් හෝ දැනුමින් හෝ නොව , ක්‍රියාවෙන් බව එම සමීක්ෂණ සමාගම අවසානයේ නිගමනය කළේ ය.

ඉදිරිපත් කිරීම : ෂෙං ලී



# කඳු සමතලා කළ අධිෂ්ඨානය 愚公移山

චීන ජාතිකයන්ගේ කතා ව්‍යවහාරවලත් රචනාවලත් ප්‍රස්ථා පිරුළු සහ ආප්තෝපදේශ නිරන්තරව අසන්න දැකිය හැකිය. 'යූ ගොං යී ශැන්' ලෙස හැඳින් වන ප්‍රස්ථා පිරුළ නිතරම භාවිත කෙරේ. පදානුගතව යූ ගොං නම් පුද්ගලයා කන්ද සමතලා කිරීම යන අර්ථය එයින් කියැවෙයි. ඔබට මේ ප්‍රස්ථා පිරුළේ අර්ථය අනුමාන කර ගත හැකි නේ ද? ඔව්. මේ අධිෂ්ඨානය ගැන පිරුළකි.

පැරණි කාලයේ ටයි හං සහ වාං වූ නම් කඳු දෙකක් තිබිණ. ඒ කඳුකරයට උතුරු පැත්තෙන් යූ ගොං නම් 90 හැවිරිදි වියපත් පුද්ගලයෙක් සහ ඔහුගේ පවුලේ අය පදිංචි ව සිටියහ. මේ පවුලේ අයට පිටතට යන හැම විටම තමන්ගේ නිවස ඉදිරියේ තියෙන මහ කඳු දෙක වටා ගමන් කිරීමට සිදු විය. හැම දාම එසේ ගමන් කිරීම ඇත්තටම ලොකු කරදරයක් සහ කාලය නාස්ති කරන දෙයකි. දවසක් යූ ගොං පවුලේ අය කැඳවා ඔවුන්ට මෙසේ කීවේය:

'අපි අප නිවස ඉදිරියේ තියෙන වාං වූ සහ ටයි හං කඳු කපා දකුණ දිසාවට යන්න පාරක් හදමු.'

යූ ගොංගේ යෝජනාවට සියළු අයගේ අනුබලය ලැබිණ. ඒත් යූගොංගේ බිරිඳ ස්වාමියාගෙන් ප්‍රශ්න කළාය:







'ඇත්තටම සියළු දෙනාගේ ශක්තිය එකට එක් කළත් අපිට වං වූ සහ ටයි හං වගේ ලොකු කඳු තියා කුඩා කන්දක් වත් ඉවත් කරන්න බෑ නෙ. අනිත් එක අපි ඒ කඳු කපන කොට ලැබෙන පස් සහ ගල් කොහේ ද දමන්නේ?'

පවුලේ අය සාකච්ඡා කිරීමෙන් පසු තීරණය කළා කඳු කපා ඉවත් කිරීමෙන් ලැබෙන පස් සහ ගල් නැගෙනහිර මුහුදු වෙරළට සහ උතුරේ දුරස්ථතම ස්ථානයකට ගෙන ගොස් දැමීමට.

චී සෝ නම් වියපත් ගම් වැසියෙක් යූ ගොංගේ තීරණය ගැන දැන ගෙන ඒ අදහස අත්හැර දමන්න ඔහුට බල කිරීමට හිතුවේය.

'ඔය විදියට කරන එක මෝඩකමක්. ඔබේ ශක්තිය සීමිතයි නෙ. එතකොට කොහොම ද ඔබට මේ මහ කඳු දෙක සමතලා කරන්න පුළුවන් වෙන්නේ?'

යූ ගොං මෙසේ පිලිතුරු දුන්නේය:

'ඔබ ආත්මාර්ථකාමියි. මම මැරුණාට පස්සේ මගේ පුතුන් දිගටම මේ වැඩේ කරනවා. පුතුන් මාරුණාට පස්සේ තව මුණුපුරන් ඉන්නවා. මුණුපුරන් මැරුණාට පස්සේ එයාලාගේ පුතුන් දිගටම ඒ වැඩේ කරනවා. අපේ පවුලට මෙහෙම කෙළවරක් නැතුව අලුත් අය එකතු වෙනවා. ඒත් ඒ කඳු දෙක කවදාවත් මීට වඩා උස යන්නේ නෑ. එතකොට ඕක සමතලා කරන්න අපිට කවදා හරි පුළුවන් වෙනවා.'

යූ ගොං තම පවුලේ අය මෙහෙයවා දිනපතාම කඳු කපා ඉවත් කිරීමට පටන් ගත්තේය. කඳු දෙවියා ඒ ගැන ඉහල දෙව්ලොවේ අධිරාජ්‍යයාට වාර්තා කළේය. ඉහල දෙව්ලොවේ අධිරාජ්‍යයා යූ ගොංගේ අධිෂ්ඨානය සහ අවංකකමෙන් සංවේගයට පත් විය. දෙවියන්ගේ නියෝගය අනුව, මහ ශක්තිමත් දෙවිවරු දෙදෙනෙක් ඒ කඳු දෙක කරේ තියා ගෙන වෙන තැනකට රැගෙන ගිය බව තමයි ජනප්‍රවාදයේ සඳහන් වෙන්නේ. ඉන් පසුව යූ ගොං ඉන්න ගම්මානයේ සියළු අයට කඳු බාධාව නැති විය.

'යූ ගොං යී ශැන්' යන චීන පිරුළෙන් දුෂ්කරතාවන්ට නැතිනම් ලෝක ස්වභාවයට බිය නැතුව එයට මුහුණ දීමේ ධෛර්ය සහ අධිෂ්ඨානය වර්ණනා කෙරේ.

ඉදිරිපත් කිරීම : ලියු හුයි



# ළමා සාහිත්‍යයේ නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලද
# චීන ලේඛකයා

ඔබට මතක ද වසර 2015 චීනයේ ලේඛකයෙක් හියුගෝ සම්මානය දිනා ගත්ත කතාව? ඒ ලේඛකයාගේ නම ලියු ට්සි ශින්. ඔහු එම සම්මානය දිනා ගත්තේ ඔහුගේ 'ද ත්‍රී බොඩි ප්‍රොබ්ලම්' නමැති දිගු විද්‍යා ප්‍රබන්ධ නව කතාවට. ලෝක විද්‍යා ප්‍රබන්ධ නව කතා ක්ෂේත්‍රයේ ඉහලම සම්මානය වන හියුගෝ සම්මානය පළමු වරට චීන ලේඛකයෙකුට හිමි වූ අවස්ථාව එයයි. හියුගෝ සම්මානය වගේම ලෝක සාහිත්‍ය ක්ෂේත්‍රයේ තව වැදගත් සාහිත්‍ය සම්මාන කිහිපයක් තිබේ. ඒ අතරින් ජාත්‍යන්තර හැන්ස් ක්‍රිස්ටියන් අන්ඩර්සන් සම්මානය සුවිශේෂ එකකි. එය ළමා සාහිත්‍ය ලෝකයේ නොබෙල් සම්මානය ලෙස හැඳින් වෙයි. ඒ නිසා පසුගියදා ට්සාඕ වෙන්ශුවාන් නමැති චීන ලේඛකයා එම සම්මානය දිනා ගැනීම චීන සාහිත්‍ය ක්ෂේත්‍රයටත් සාහිත්‍ය ප්‍රේමීන්ටත් ප්‍රබෝධජනක ආරංචියක් විය.

වසර 1954 ඉපදුණු ට්සාඕ වෙන්ශුවාන් පිකිං විශ්ව විද්‍යාලයේ චීන භාෂා පීඨයේ මහචාර්යවරයෙකි. සම්මානය ලබා ගත් බව දැන ගැනීමෙන් පසු ඔහු මාධ්‍ය වේදින්ට මෙලෙස කීවේය:











‘මට සම්මානය හිමි වුණේ මගේ රචනා විශේෂ නිසා. එහි චීන අනන්‍යතාව කැපී පෙනෙනවා. ඒත් ඒවා මානව සංහතියට අදාළයි. එය චීන කතා වුණත් සමස්ත මානව සංහතියටම අයිති කතා ලෙස හඳුන්වන්න පුළුවන්.’

ට්සාඕ වෙන්ශුවාන්ගේ නිර්මාණ කවරාකාරයේ ද? හැන්ස් ක්‍රිස්ටියන් අන්ඩර්සන් සම්මානයේ තීරක කමිටු සභාපතිනි පැට්‍රිසියා අල්ඩනා මෙසේ අගය කළාය:

‘ඔහුගේ ‘තඹ සහ සූර්යකාන්ත මල්’ චීනයේ සංස්කෘතික විප්ලව කාලයේ ගම්බද ප්‍රදේශයක පසුබිමක් මත නිර්මාණය කළ කතාවක්. ‘ඩිං ඩිං සහ ඩාං ඩාං’ යන කතාව වෙන් ව සිටින මන්ද මානසික සොහොයුරන් දෙ-දෙනෙකු එකිනෙකා සොයා ගැනීම ගැන කියැවෙන ඉතා සංවේදී කතාවක්. ළමුන්ගේ ජීවිතය ඛේදජනක වෙන්න පුළුවන්. ඒත් අවශ්‍යතාවන් තියෙන අවස්ථාවන්වලදී ළමුන්ට නිතරම මානව ගුණය දැනෙන එක වටිනවා.’

ජර්මානු චිත්‍ර ශිල්පිනියක් වන සෝනියා දනොව්ස්කි, ට්සාඕ වෙන් ශුවාන්ගේ ‘තණ සෙවිලි නිවස’ වෙනුවෙන් චිත්‍ර ඇඳ්ඳාය. ඇය එම කතාව කියවන විට එහි චරිතවල ස්වභාවය සහ එහි කතාංග ගැන තදින් ඇගේ සිත ඇද ගත්තේය. තමාට සෑම පිටුවකටම චිත්‍රයක් අඳින්න තරම් ප්‍රබෝධමත් හැඟීමක් මතු වූ බව ඇය කීවාය.









සෝනියා දනොව්ස්කි සඳහන් කළ 'තණ සෙව්ලි නිවස' ට්සාඕ වෙන්ශුවාන් නිර්මාණය කළ නව කතාවකි. එහි ප්‍රධාන චරිතය 'සාං සාං'. 'සාං සාං' ඇතුළු දරුවන් පස් දෙනාගේ කුඩා කාලයේ අත්දැකීම් ඊට පසුබිම් වෙයි. දරුවන් අතර අවංක මිතුදම, වැඩීමේ දුක, සංවේග සිදුවීම්, අවාසනාවන්ත දරුවෙක් තමන්ගේ දෛවය එක්ක සටන් කිරීම, වියපත් වැඩිහිටියෙකුගේ අවසාන මොහොතේ විදහා පාන මානව ස්වභාවයේ ආලෝකය යනාදිය එම නව කතාවෙන් නිරූපනය වෙයි.

ට්සාඕ වෙන්ශුවාන්ගේ නිර්මාණ ජනප්‍රිය ව තිබෙන්නේ චීනය තුළ විතරක් නෙවෙයි. ඔහුගේ කතා සහ රචනා රැසක් ඉංග්‍රීසි, ප්‍රංශ, ජපාන, ජර්මානු සහ කොරියානු භාෂාවලට පරිවර්තනය කොට පළ කර ඇත. කවදා හෝ දවසක සිංහල පරිවර්තනත් හමු වෙනවා නම් එය ලාංකික ළමුන්ට හොඳ ආරංචියක් වේවි කියා විශ්වාස කළ හැකිය.





ඉදිරිපත් කිරීම : ලියු හුයි



# චීන ගැටයේ

ඉදිරිපත් කිරීම : ෂාඕ ජී යං

චීන ගැටය යනු, ගැට එක්තැන් කිරීමෙන් සෑදූ චීනයට ආවේණික සැරසිලි භාණ්ඩ වර්ගයකි. වසර පන්දහසක ඉතිහාසය තුළ අක්ෂර සොයා ගෙන නොමැති කාලවලදී, අක්ෂර වශයෙන් ගැට භාවිත කරනු ලැබිණ. කලා හා සෞන්දර්ය ක්ෂේත්‍රවලදීත් චීන ගැටය වැදගත් ස්ථානයක පසු වෙයි.

චීනයේ ගැට ගැසීමේ ක්‍රමය ඇති වූයේ පුරාතන කාලයේදී ය. එකල අක්ෂර නොතිබිණ. කඹයක වෙනස් වෙනස් ගැට ගැසීම ආධාරයෙන් ඇතැම් කාරණා මතක තබා ගැනීම සඳහා, ක්‍රමවේදයක් සකසා ගෙන තිබිණ. වැදගත් සිද්ධියක් වූ විට ලොකු ගැට ගැසූ අතර සුළු සිද්ධි සඳහා කුඩා ගැට යෙදිණ.



චීන ගැටය පිළිබඳ ඉතිහාසය මානව ඉතිහාසය තරමටම දිග ය. දීර්ඝ සංස්කෘතික වර්ධන ක්‍රියාදාමයේදී, චීන ගැටයෙන් චීනයට ආවේණික සරුසාර සංස්කෘතිය පිළිබිඹු වෙයි. කඹය යන්න, චීන භාෂාවෙන් 'ෂෙං' යනුවෙන් උච්චාරණය කෙරෙන අතර දෙවියා යන්න 'ෂෙන්' යනුවෙන් උච්චාරණය කෙරේ. සමීප උච්චාරණ නිසා, චීන සංස්කෘතිය හැඩ ගැසෙමින් පැවැති අදියරේදී චීන ජාතිකයෝ කඹයට වැඳුම් පිදුම් කළහ. කඹයට මකරකුගේ හැඩයක් තිබෙන නිසාත්, චීන ජාතිකයන් මකරුන්ගේ පැවත එන්නන් බව විශ්වාස කෙරෙන නිසාත්, ප්‍රාග් ඓතිහාසික යුගයේදී, මකර දෙවියාගේ ස්වරූපය කඹ ගැටවලින් නිරූපණය කෙරිණ. එමෙන්ම, ගැටය යන්න, චීන භාෂාවෙන් 'ජියැ' යනුවෙන් උච්චාරණය කෙරේ. ශක්තිමත්භාවය සහ සුසංගතභාවය සැඟ වෙන මෙම අක්ෂරයෙන් එකතු වීම, සමීප වීම සහ උණුසුම් වීම යනාදි හැඟීම් සංකේතවත් වෙයි. 'ජියැ' යන උච්චාරණය 'ජි' යන උච්චාරණයට සමීප ය. 'ජි' යන අක්ෂරය, සෞභාග්‍යය, පොහොසත්කම, දීර්ඝායුෂ, ප්‍රීතිය, සාමය හා නිරෝගීභාවය ඇතුළු සරුසාර අර්ථවලින් සමන්විත ය. මෝස්තර හා වර්ණ පිළිබඳ සුන්දරත්වය චීන ගැටයෙන් දැක්වෙන අතර පැරණි චීනයේ සංස්කෘතික විශ්වාස විදහා දැක්වෙයි. චීන ජනතාවගේ සත්‍යයේ, යහපත්කමේ

සහ සුන්දරත්වයේ අභිලාෂය එයින් පෙන්නුම් කෙරේ. ඒ නිසා, මෙම ජන ශිල්පයට දිගු මෙන්ම ප්‍රාණවත් ජීව ගුණයක් හිමි ය.

අනතුරුව, ගැට මෝස්තර වැඩි වශයෙන් භාවිත කෙරුණේ ඇඳුම් සහ ආභරණ මත ය. ප්‍රායෝගි ක භාවිතයේ සිට සැරසිලි අලංකරණය දක්වා අනුක්‍රමයෙන් පරිවර්තනය වූ චීන ගැටය, ප්‍රීතිමත් හා වාසනාවන්තභාවයේ සංකේතයක් බවට පත් වී තිබේ. චිං යුගයේදී, චීන ගැටය ඉතාමත් විශිෂ්ට මට්ටමක් දක්වා වර්ධනය වී එයින් බොහෝ සැරසිලි හා මෝස්තර ඇති වී තිබිණ. එම කාලයේ සිට, මෙය සැරසිලි අලංකරණයේ සිට කලාත්මක නිර්මාණයක් දක්වා ඉහළ නැංවිණ.

චීන ගැට සෑදීමේ ප්‍රධාන ද්‍රව්‍යය වනුයේ නූල් ය. නූල්, සේද, කපු, හණ, නයිලොන් සහ මිශ්‍ර වූ වර්ග තිබේ.

චීන ගැට ගෙතුම් ශිල්පයේ විශේෂතම ලක්ෂණය වනුයේ සෑම ගැටයක්ම එක නූලකින් ගෙතීම ය. සෑම ගැටයක්ම ගෙතීමට එක් ගෙතුම් ක්‍රමයක් තිබේ. එහි වෙනස් රූපවලට අනුව, සෑම ගැටයකටම වෙනස් නම් තිබේ.

නූල් තෝරා ගන්නා විට, වර්ණ සංයෝජනය ඉතාමත් වැදගත් ය. හරිතමණි ඇතුළු පැරණි භාණ්ඩ වෙනුවෙන් සැරසිලි ගැට ගෙතීමට දුඹුරු හෝ තද කොළ ආදී ගැඹුරු වර්ණ තෝරා ගත යුතු ය. සරල හා ගැඹුරු වර්ණවලින් යුත් භාණ්ඩයක් වුවහොත්, රන්, රිදී හෝ රතු ආදී වර්ණ සහිත සිහින් නූල් ස්වල්පයක් ගැටවලට එකතු කිරීමෙන් මෙම භාණ්ඩය වඩා විචිත්‍ර හා දීප්තිමත් ලෙස පෙනේ.

නූල් භාවිතය හැර, ගැට සැරසිලි භාණ්ඩවලට වටකුරු හෝ නළා හැඩැති පබළු ඇට ඔබ්බනු





ලැබේ. හරිතමණි, රත්රන්, රිදී, පිඟන් හා එනමල් යනාදි ආභරණ ද ඊට එකතු කළ හැකි ය. වෙනස් නූල්වලින් වෙනස් හැඩ හා විලාස සහිත චීන ගැට ගෙතිය හැකි ය.

චීන ගැට කලාවෙන් චීනයට ආවේණික ජීවන ලක්ෂණ ප්‍රදර්ශනය කෙරේ. චීන ගැටවල සුන්දර පෙනුමින් පුරාතන කාලයේ අද්භූතභාවය සහ චීන ජනතාවගේ බුද්ධිය පෙන්නුම් කෙරේ. සෑම සමරු උත්සවයකදීම, චීන ගැට, සැරසිලි භාණ්ඩ වශයෙන් නිවාස තුළ එල්ලා තබනු ලැබෙන අතර තෑගි වශයෙන් ද නෑදෑ මිතුරන්ට පරිත්‍යාග කරනු ලැබේ. එහි අලංකාර මෝස්තරවලින් සහ සාම්ප්‍රදායික විලාසවලින්, උත්කර්ෂවත්භාවය හා ප්‍රීතිමත්භාවය තහවුරු වෙයි.



# 《每日汉语》 එදිනෙදා චීන බස

## 在街上买食物 මග දෙපස කඩවලින් ආහාර මිලට ගැනීමේදී

### 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 你们喜欢吃辣的吗？ | නිමන් ශි හුඅන් චි ලා ද මා?<br>ඔයාලා කැමති ද සැර කෑමට? |
| 我喜欢吃羊肉串。 | වෝ ශි හුඅන් චි යන් රෝ චුආන්.<br>මම කැමතියි බැදපු එළු මස් කූරු කන්න. |
| 这里面是什么？ | චර් ලි මියන් ෂි ෂෙන් ම ?<br>මේ ඇතුලේ තියෙන්නේ මොනවා ද? |
| 我们去买点饮料吧。 | වෝ මෙන් චියු මයි ඩිඅන් යින් ලිඕ බා.<br>අපි ගිහිං මොනවා හරි බොන්න ගමු ද? |

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 你们喜欢吃辣的吗？ | නි මෙන් ෂි හුඅන් චි ලාද මා?<br>ඔයාලා කැමති ද සැර කෑමට? |
| 喜欢。 | ෂි හුඅන් .<br>කැමතියි. |

#### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 你想吃什么？ | නි ෂිඅන් චි ෂන් ම .<br>ඔයා මොනවා ද කන්න කැමති? . |
| 我喜欢吃羊肉串。 | වෝ ෂි හුඅන් චි යන් රෝ චුආන්.<br>මම කැමතියි බැදපු එළු මස් කූරු කන්න. |

#### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 这里面是什么？ | චර් ලි මියන් ෂි ෂෙන් ම?<br>මේ ඇතුලේ තියෙන්නේ මොනවා ද? |
| 我也不知道。 | වෝ යෙ බු ජි දෝ.<br>මමත් දන්නේ නැහැ. |

#### 对话四 හතරවන සංවාදය

| | |
|---|---|
| 我们去买点饮料吧。 | වෝමෙන් චියු මයි ඩිඅර් යින් ලිඕ බා .<br>අපි ගිහිං මොනවා හරි බොන්න ගමු ද? |
| 你喜欢红茶还是绿茶呢？ | නි ශි හුඅන් හුන් චා හයි ෂ ලියු චා න?<br>බ්ලැක් තේ හෝ ග්‍රීන් තේ? |
| 红茶 | හෝන් චා.<br>බ්ලැක් තේ |

### චීන සංස්කෘතියෙන් බිඳක්

කෑම ගැන කතා කරන විට හැන්දයි ගෑරුප්පුවයි අමතක නොකරම බෑ වගේම චීන චොපස්ටික්ස් එහෙම නැත්නම් චීන මිනිස්සු කෑම කන්න භාවිතා කරන කෝටුත් අමතක කරන්න බැහැ. මේ චීන කෝටු ගැනත් හැදි ගෑරුප්පු ගැනත් ලෝකයේ අනන්තවත් පර්යේෂණ සමීක්ෂණ සිදු වී තිබෙනවා. චීනය කියන්නේ අතීතයේ සිට කෘෂි කර්මාන්තය මූලික වූ සමාජයක් නිසා චීන මිනිස්සු වැඩිපුර ආහාරයට ගත්තෙත් එළවළු ජාතියි. ඉතින් බත් එළවළු කන්න ඔවුනට වඩාත් පහසු ක්‍රමය වුණේ කෝටු (චොප්ස්ටික්ස්) ඊට සාපේක්ෂව බටහිර ජතීන් දෙස බැලුවහොත් ඔවුන් ආහාරයට වැඩිපුර එකතු කර ගත්තේ මස් වර්ගයි. ඒ කියන්නේ මස් වර්ග ආහාරයට ගැනීමේදී ඔවුන්ට අනිවාර්යෙන්ම හැදි ගෑරුප්පු වැනි මෙවලම් අත්‍යාවශ්‍ය වුණා. එපමණක් නොවේ. සාමාන්‍යයෙන් චීන මිනිස්සු එකට හිඳ කෑම කන්න වඩාත් කැමතියි. එකම දීසියකින් හෝ බඳුනකින් කිහිපදෙනෙක් කෝටු වලින් අහාර බෙදා ගන්න එක චීන සිරිතයි.කෝටු වලින් ආහාර ගන්න නිසා එකවර ලොකු ප්‍රමාණයක් කෙනෙකුට බෙදා ගැනෙන්නෙත් නැහැ. එහි ඇති ගැඹුරු අදහස නම් ප්‍රාර්ථකාමිත්වයයි. ආත්මාර්ථකාමීත්වය හෝ පෞද්ගලික වාසිය එමගින් ඉස්මතු වෙන්නේ නැහැ. නමුත් බටහිර ලෝකය මීට හුඟක් වෙනස්. තමන්ම බෙදාගත් කෑම තමන්ගේම පිඟානෙන් රස විඳීම වැනි සරළ ක්‍රමයක් එහි තියෙන්නේ.

මතක තියාගන්න, බත් පිරවූ බඳුනකට චොප්ස්ටික්ස් කූරු වලින් ඇනීම වගේම හැන්දකින් හෝ චොප්ස්ටික් කූරු වලින් කෑම බඳුන් වලට තට්ටු කිරීම හෝ නාද කිරීමත් නරක හැසිරීමක් හා පුරුද්දක් විදිහටයි චීන මිනිස්සු සළකන්නේ.

# 《每日汉语》එදිනෙදා චීන බස

## 家庭聚会 පවුලේ අයගේ එකතුවීමකදී

### 今日关键 අද පාඩමෙන් අවධානය

| | |
|---|---|
| 我很高兴认识你的家人。 | වෝ හන් ශෞ ෂින් රෙන් ෂි නි ද ජ්‍යා රෙන් .<br>මට හුඟක් සතුටුයි ඔයාගේ පවුලේ අය අඳුනාගන්න ලැබුණාට. |
| 这是我的拿手菜。 | චර් ෂ වෝ ද නා ෂිවෝ සයි.<br>මේ මගේ විශේෂිතම ව්‍යාංජනයි. |
| 你多吃点儿。 | නි ඩෝ චි දියැන්ර්.<br>ඔයා තව පොඩ්ඩක් කන්න. |
| 下次请你们到我家做客。 | ෂියා චි චිං නිමෙන් දෝ වෝ ජ්‍යා සුඕ ක.<br>ඊළඟ වතාවේ ඔයාලා මගේ ගෙදරට අමුත්තො වෙලා එන්න ඕන. |

### 完整对话 සම්පූර්ණ සංවාදය

#### 对话 一 පළමු සංවාදය

| | |
|---|---|
| 欢迎你来做客。 | හොන් යින් නි ලැයි සුඕ ක.<br>ඔයා අපේ ගෙදරට පැමිණීම පිළි ගන්නවා. |
| 我很高兴认识你的家人。 | වෝ හන් ශෞ ෂින් රෙන් ෂි නි ද ජ්‍යා රෙන්.<br>මට හුඟක් සතුටුයි<br>ඔයාගේ පවුලේ අය අඳුනාගන්න ලැබුණාට. |

#### 对话 二 දෙවන සංවාදය

| | |
|---|---|
| 味道怎么样? | වේ ටඕ සන් ම යන්?<br>රස කොහොම ද? |
| 真的很好吃。 | චැන් ද හන් හඕ චිර්.<br>ඇත්තටම හුඟක් රහයි. |

#### 对话 三 තෙවන සංවාදය

| | |
|---|---|
| 这是我的拿手菜。你尝尝。 | චර් ෂ වෝ ද නා ෂිඕ සයි .නි චං චං .<br>මේ මා උයන්නට හපන් ම ව්‍යාංජනයක්<br>කන්න බලන්න එහි රස. |
| 不错。挺好吃的。 | බු සුවෝ තින් හාඕ චි ද .<br>හොඳයි හරම රසයි . |

#### 对话四 හතරවන සංවාදය

| | |
|---|---|
| 下次请你们到我家做客。 | ෂියා චි චිං නිමෙන් දෝ වෝ ජ්‍යා සුඕ ක .<br>ඊළඟ වතාවේ ඔයාලා මගේ ගෙදරට එන්න ඕන . |
| 有时间一定去。 | යුඕ ෂි පින් යි දියින් චියු .<br>වෙලාව තියනවා නං යන්නම්. |

### චීන සංස්කෘතියෙන් බිඳක්

වසන්ත උත්සවය, එහෙම නැත්නම් චීන අලුත් අවුරුද්ද කියන්නේ චීනයේ විශාලතම විවේක සමයයි. දුර බැහැර ඉගෙනුම ලබන සිසුන්ට වගේම සේවකයින්ටත් මේ කාලයේ නිවාඩු ලැබෙනවා. චීන අලුත් අවුරුද්ද අපේ සිංහල අලුත් අවුරුද්ද වගේ තමයි. පවුලේ සාමාජික සාමාජිකාවන් මේ කාලයේදී එකට එකතුවීම ඉතාමත් වැදගත් ලෙසටයි සැලකෙන්නෙ. මිනිස්සු තම තමන්ගේ නිවසේ අලුත් අවුරුද්ද වෙනුවෙන් ඉතා යුහුසුළුව සූදානම් කරනවා. නිවෙස් අලුතින් වර්ණ ගැන්වීම, අලුත්වැඩියා කිරීම ඒ කාලයට බොහොම සුළබ දසුනක්. නිවසේ පැරණි භාණ්ඩ වෙනුවට අලුත් අලුත් භාණ්ඩ වර්ගත් මේ කාලෙදි නිවැසියන් විසින් ගෙන එනවා. ඒ වගේම වසන්ත උත්සව කවි පද 'චුන් ලියැන්' වලටත් මේ කාලෙදි ඇත්තේ ඉහළ තැනක්. රතු පැහැති කඩදාසි වල ලියූ විවිධ නව අවුරුදු සුබ පැතුම් වැකි නිවසේ ප්‍රධාන දොරටුව දෙපස හෝ ජනෙල් මත ඇලවීමත් චීන ජාතිකයින් සිදු කරනවා 'ෆු'එහෙම නැත්නම් 'ෆු සර්' කියන්නේ චීන බසින් 'ආශිර්වාද' වාසනාව හෝ සතුටු සම්පත කියන තේරුමයි. චීන අලුත් අවුරුදු කාලේ මේ අකුර සහිත රත් පැහැ කඩදාසි චීන නිවෙස් දොරටු වල බහුලව දැකිනට පුළුවන්. හැබැයි විශේෂත්වය තමයි මේ අකුර උඩ යටට හිටින විදිහට තමයි ඔවුන් අලවන්නේ. ඊට හේතුව මේ අකුර දකින කෙනෙකුගේ මුවින් 'ෆු දෝ ල' ඒ කියන්නේ 'ෆු'කැරකැවිලා කියලා කියැවුණත් ඒ ශබ්දයටම සමාන'ෆු ඩෞ ල'කියන්නේ වාසනාව ළඟාවෙලා කියන තේරුමයි.

# චොංශෑන් විශ්ව විද්‍යාලය



දකුණුදිග චීනයේ ග්ආංචෞ නගරයේ පිහිටි චොංශෑන් විශ්ව විද්‍යාලය චීනයේ පැරණිතම මෙන් ම ප්‍රකට ම ද විශ්ව විද්‍යාලයකි. මේ අතර එය එහි සුන්දර දර්ශනයක් හේතුවෙන් ද චීනය පුරා ප්‍රකට ය.

චොංශෑන් විශ්ව විද්‍යාලය වසර 1924දී චීනයේ ප්‍රකට දේශපාලනඥයෙකු වන සුන් යාට් සෑන් මහතාගේ යෝජනාවක් මත ඉදි කර ඇත. ඇමෙරිකාවේ ඇගයීම් ආයතනයක වාර්තාවකට අනුව, චීනයේ හොඳ ම විශ්ව විද්‍යාල පිළිබඳ ලේඛනයේ චොංශෑන් විශ්ව විද්‍යාලය අට වන ස්ථානයේ පසු වෙයි.

චොංශෑන් විශ්ව විද්‍යාලයට ඇතුල්වීම සඳහා වාර්ෂික ව චීනය පුරා විශිෂ්ට ශිෂ්‍ය ශිෂ්‍යාවෝ විශාල පිරිසක් දැඩි තරගකාරිත්වයකින් යුතුව ක්‍රියා කරති. රට පුරා විශිෂ්ට ශිෂ්‍යයන් ඒකරැස්වීම හේතුවෙන් වාර්ෂික ව චොංශෑන් විශ්ව විද්‍යාලය සමාජයට විශිෂ්ට උපාධිධාරීන් විශාල පිරිසක් බිහි කරයි. එසේ බිහි වූ අය අතරින් බොහෝ දෙනෙක් පසුව චීනයේ ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් බවට පත් වූහ. චීනයේ ප්‍රකට උගතෙකු වන තීන් යීන් මහත්මිය ද මෙම විශ්ව විද්‍යාලයේ ආදිශිෂ්‍යාවකි. රටේ වෙනත් ක්ෂේත්‍ර රැසක විශිෂ්ඨයන් රාශියකුත් මෙම විශ්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන් ය. මේ අතර, චීන ඉතිහාසයේ සුප්‍රකට උගතුන් බොහෝ දෙනෙක් ගුරුවරුන් ලෙසට මෙහි කටයුතු කර තිබේ. ඒ අතරින් චීනයේ ප්‍රකට උගතුන් වන ලූ ෂෙන්, ස්ඈයි යුඈන් පෙයි, ග්ඖ ම රොයි, යූ තයි ෆූ, වාං ලී, ෆූ ස් න්‍යැයි, ග්වූ ෂේ ගාං, චූ ජ්‍යා හුආ යන අය ද සිටිවූහ.

වර්තමානය වන විට චීනයේ උසස් ම පෙළේ විද්‍යාඥයෝ දහයකට අධික පිරිසක් ද චොංශෑන් විශ්ව විද්‍යාලයේ ඉගෙනීම් හා පර්යේෂණ කටයුතුවල නිරත වී සිටිති. ඒ නිසා රටේ සංවර්ධනය හා සමෘද්ධිය වෙනුවෙන් චොංශෑන් විශ්ව විද්‍යාලය කදිම පිටුබලයක් බව සඳහන් කළ හැකි ය.

චීනයේ විශ්ව විද්‍යාල අතරින් චොංශෑන් විශ්ව විද්‍යාලය විශිෂ්ට කලා අධ්‍යාපනය නිසා සුප්‍රකට ය. එහි ඇති පීඨ අතරින් 39ක් ජාතික වැදගත් පීඨ ලෙස ස්ථාපිත කර ඇත. ඒ අතරින් චීන භාෂා, දර්ශනය, ඉතිහාසය, කළමනාකරණය වැනි විෂයයන් වඩා ජනප්‍රිය ය. චීනයේ පශ්චාත් උපාධිධාරී අධ්‍යාපනය සඳහා මෙම විශ්ව විද්‍යාලයේ විශේෂ දායකත්වයක් ලබා දී තිබේ.

චොංශෑන් විශ්ව විද්‍යාලය තුළ ශිෂ්‍යයෝ 80000කට අධික පිරිසක් සිටිති. ඒ අතරින් රටවල් 80කට වැඩි ප්‍රමාණයකින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ පිරිසක් සිටීම විශේෂත්වයකි. මේ අතර, පසුගිය වසර වන විට

චොංශෑන් විශ්ව විද්‍යාලයේ ගුරුවරුන්ගේ සංඛ්‍යාව 3400 ඉක්මවා ගොස් ඇත. ඒ අතරින් 2000කට වැඩි පිරිසක් ආචාර්ය උපාධි ලබා ගත් අය වෙති.

උසස් අධ්‍යාපනය හැදෑරීම පිණිස චීනයට පැමිණි විදේශ ශිෂයන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වීම මෑත වසරවල දක්නට ලැබෙන දර්ශනයකි. මෙවැනි පසුබිමක් යටතේ, චොංශෑන් විශ්ව විද්‍යාලය වැනි චීනයේ ඉහළ ම පෙළේ විශ්ව විද්‍යාල විදේශ ශිෂ්‍යයන්ගේ වැඩි අවධානයක් ඇද ගනී. මෑත වසරවල චොංශෑන් විශ්ව විද්‍යාලයේ අංශ රැසක් ද විදේශ ශිෂ්‍යයන් බඳවා ගනී. සාමාන්‍ය උපාධිය සඳහා විදේශ ශිෂ්‍යයෙකුට මෙහි අවුරුදු 4ක් ඉගෙන ගැනීමට අවශ්‍ය ය. චීන භාෂා, වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් අධ්‍යානය කළ හැකි ය. ගුරුවරුන් බහුතරය චීන ජාතිකයන් වීම නිසා සාමාන්‍යයෙන් ශිෂ්‍යයන්ට උගන්වනු ලබනුයේ චීන භාෂාවෙනි. ඒ නිසා විදේශ ශිෂ්‍යයන් පැමිණි මුල් කාලයේදී චීන භාෂාව ඉගෙන ගත යුතු ය. එහෙත්, ඉංග්‍රීසි භාෂාවෙන් ද ඉගැන්වීම් කටයුතු සිදු වෙයි. පශ්චාත් උපාධිය සඳහා සාමාන්‍යයෙන් අවුරුදු 2, 3ක් ගත වෙයි. ආචාර්ය උපාධිය සඳහා අවුරුදු 4ක් අවශ්‍ය ය. චොංශෑන් විශ්ව විද්‍යාලය තුළ නිල උපාධි අධ්‍යාපනයට අමතරව කෙටිකාලික පුහුණු සහ හුවමාරු අධ්‍යාපන වැඩසටහන් ද ස්ථාපිත කර ඇත. ඒවැනි අධ්‍යාපනයක් ලබන විදේශ ශිෂ්‍යයෝ සාමාන්‍යයෙන් මෙහි අවුරුදු 1, 2ක් පමණ සිටිති. ඔවුන්ට උපාධිය වෙනුවට සහතික පත්‍රයක් හිමි වෙයි.

චොංශෑන් විශ්ව විද්‍යාලයට ඉතා විශිෂ්ට පහසුකමක් හිමි වෙයි. පන්ති කාමර, නේවාසික කාමර විශාල ප්‍රමාණයකට අමතරව, ක්‍රීඩාංගන කිහිපයක් ද එහි තිබේ. පිහිනුම් තටාක කිහිපයක් ද එහි ඇත. ඊට අමතරව, ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳ පොත්පත් සහ ලිපිලේඛන මිලියන 6කට ආසන්න සංඛ්‍යාවක් සහිත නවීන පුස්තකාලයක් ද එහි ඇත. ඒ නිසා ජීවිතය සහ අධ්‍යාපනය පිළිබඳව ඔබට එහි පහසුවක් ලැබෙයි.

චොංශෑන් විශ්ව විද්‍යාලය පිළිබඳ වැඩිපුර තොරතුරු සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න.

http://www.sysu.edu.cn










ඉදිරිපත් කිරීම : හැන් ජියැන්





# හැන් හැන්

ඉදිරිපත් කිරීම : බූ යුන්

හැන් හැන්, චීනයේ සුප්‍රකට ලේඛකයෙක්. ඒ මෙන්ම ඔහු චිත්‍රපට නිෂ්පාදනය සහ රිය පැදවීමේ වෘත්තීය තරගයන්ට නිතරම සහභාගි විය. ඔහු චීනයේ විශිෂ්ට තරුණයන්ගේ නියෝජිතයෙක් ලෙස සැලකේ.

1982 වසරේ සැප්තැම්බර් මාසයේ 23වැනිදා හැන් හැන් චීනයේ ශන් හයි නගරයේ උපත ලැබීය. ප්‍රාථමික පාසල් කාලය අවසන් වූ විට ඔහු ක්‍රීඩා විශිෂ්ටත්වය සහිත ශිෂ්‍යයෙක් වශයෙන් මධ්‍ය පාසලට ප්‍රවේශ විය. මධ්‍ය පාසලේ සිටිද්දී ඔහු පුවත් සහ සඟරාවලට ලිපි නිකුත් කළේ ය. 1999 වසරේ මධ්‍ය පාසලේ සිටියදී හැන් හැන් සමස්ත චීනයේ ප්‍රථම රචනා තරඟයට සහභාගි විය. ඔහු පළමුවන ස්ථානය හිමි කර ගත්තේ ය. ඊට අමතරව 2000 වසරේ හැන් හැන් යළිත් මෙම තරඟයේ දෙවන ස්ථානය හිමි කර ගත්තේ ය. එහෙත් හැන් හැන්ට සාහිත්‍යය හැර වෙනත් විෂයන්ට හොඳ ලකුණු ලබා ගැනීමට නොහැකි විය. ඒ හේතුවෙන් 2000 වසරේ හැන් හැන් මධ්‍ය පාසලේ ඉගෙනීම නතර කළේ ය. ඒ කාලයේ පාසලේ ගුරුවරයෙක් ඔහුගෙන් ඇහුවා, පාසලෙන් ඉවත් වුණාට පස්සේ ඔයා මුදල් හම්බ කරන්නේ කෙසේ ද ? තමාගේ ජීවිතය ගත කරන්නේ කෙසේ ද ? මට ලිපි ලිවීමෙන් මුදල් උපයා ගන්න පුළුවන් කියා හැන් හැන් උත්තර දුන්නේ ය. ගුරු-වරයා මේ බව ආසා සිනාසුණේ ය. ඊට අමතරව හැන් හැන් Triple Door නම් නවකතාව රචනා කළේ ය. මෙම නවකතාව හේතුවෙන් හැන් හැන් ප්‍රසිද්ධ විය. මෙම නවකතාව චීනයේ මිලියන දෙකක් මුද්‍රණය කරනු ලැබිණ. පසුගිය වසර විස්සක් තුළ වැඩියෙන්ම මුද්‍රණය වූ සාහිත්‍ය කෘතිය මෙයයි. ඒ විට හැන් හැන්ගේ වයස අවුරුදු දහඅටයි. 2001 වසරේ ඔහු One Degree Below Freezing නම් පොතක් රචනා කළේ ය. මෙම පොත එම වසරේ චීනයේ පොත් අලෙවි ලැයිස්තුවේ ප්‍රථම ස්ථානය හිමි කර ගත්තේ ය. 2003 වසරේ හැන් හැන් රිය පැදවීමේ වෘත්තීය තරඟයන්ට සහභාගි වීම ආරම්භ කළේ ය. ඊට අමතරව ඔහු චීනයේ ඉහළ පෙළේ රිය පැදවීමේ වෘත්තීය තරඟයේ පළමුවන ස්ථානය හය වතාවක් හිමි කර ගත්තේ ය. 2004

වසරේ හැන් හැන් වසර පහක් නම් පොත රචනා කළේ ය. එම පොතෙහි තමාගේ වසර පහක රචනා ජීවිතය පිළිබඳ සඳහන් වෙයි. මෙම පොත චීනයේ පමණක් නොවෙයි, ප්‍රංශය, දකුණු කොරියාව, සිංගප්පූර්ව සහ ජපානය යනාදී රටවල ද පළ කෙරිණ. 2005 වසරේ ඔහු අන්තර් ජාලයේ තමාගේ වෙබ් අඩවියක් ආරම්භ කළේ ය. එම වෙබ් අඩවිය හරහා ඔහුගේ ලිපි පළ කෙරිණ. 2007 වසරේ ඔහුගේ වෙබ් අඩවියට ප්‍රවේශ වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කෝටි දහය ඉක්මවා ගොස් ඇත. 2009 වසරේ The Time Weekly සඟරාව මගින් තොරා ගත් චීනය දියුණු කිරීම සඳහා දායකත්වය ලබා දුන් පුද්ගලයන් 100 දෙනෙකු අතරට හැන් හැන් ඇතුළත් විය. Asia Week සඟරාව තොරා ගත් 2009 වසරේ ආසියාවේ බලපෑම් සහගත පුද්ගලයන් අතරට ද හැන් හැන් ඇතුළත් විය. 2010 වසරේ හැන් හැන්ගේ ඡායාරූපය ඇමෙරිකාවේ Time සඟරාවේ මුල් කවරයේ පළ විය. ඒ මෙන්ම Time සඟරාව තොරා ගත් 2010 වසරේ ලෝකයේ විශාලතම බලපෑම් සහිත පුද්ගලයන් 100 දෙනා අතරට ද හැන් හැන් නම් කෙරිණ. ඇමෙරිකා ජනාධිපතිවරයා ඇතුළු ලෝකයේ සුප්‍රකට පුද්ගලයන් රැසක් එම ලැයිස්තුවට ඇතුළත් විය. 2014 වසරේ ජනවාරි මාසයේ හැන් හැන් තමාගේ ප්‍රථම චිත්‍රපට නිෂ්පාදනය කරන්නට පටන් ගත්තේ ය. එම වසරේ ජුනි මාසයේ ඔහුගේ ප්‍රථම චිත්‍රපට Never Ever Meet Again ප්‍රදර්ශනය විය. මෙම චිත්‍රපටය චීන යුවාන් කෝටි හැටක ඉහළ ආදායම් ලැබීය.







හැන් හැන් සහ ඔහුගේ බිරිඳ මධ්‍ය පාසල් කාලයේ මූණ ගැසුනේ ය. ඔහුගේ පෙම්වතිය චීනයේ මධ්‍යම නාට්‍ය ඇකඩමියේ උපාධිය ලබා ගැනීමෙන් පසු දිගටම හැන් හැන්ගේ ළඟ සිටියා ය. ඔහුගේ නිෂ්පා දකයා ලෙස කටයුතු ඇය සිදු කළා ය. 2010 වසරේ මෙම දෙදෙනා විවාහ වූහ. ඒ මෙන්ම එම වසරේ නොවැම්බර් මාසයේ ඔවුන්ට දුවක් ලැබූහ. වසර තුනකට පසු නැවත පියෙකු බවට පත් විය.

හැන් හැන් දඟකාර දරුවෙකුගේ පියෙකු සහ වගකීම සහිත තරුණයෙක් බවට පත් විය. එහෙත් වෙනත් අයට පෙනෙන ලෙසට හැන් හැන් සැලැස්මකට අනුව ජීවත් වීමට කැමති නැත. ඔහු තමාගේ අදහස් අනුව ජීවත් වෙමින් සිටියි. තමාට කියන්න කැමති දේ පවසයි. තමාට කරන්න කැමති දේ සිදු කරයි. නමුත් හැන් හැන් තමාගේ යහපත්කම ගැන අනවශ්‍ය ලෙස සිතන කෙනෙක් නොවෙයි. හැන් හැන් 1980 වසරට පසු ඉපදුනු චීන තරුණයන්ගේ සංකේතයක්. ඔහු මෙම සමාජයට නව අදහස් හා නව ජීවිත අත්දැකීම ලබා දෙයි.

මිනිසුන් දාහක් නම් ජීවිත ආකාර දාහක් තිබේ. ඒ මෙන්ම බලාපොරොත්තු දාහක් තිබේ. වෙනස්




වූ ජිවිත ආකාර සහ බලාපොරොත්තු හේතුවෙන් වෙනස් වූ ජීවිත ආකල්ප තිබේ. වෙනත් අයගේ ජීවිත ආකල්ප අනුව තම ජීවිත ආකල්පය ගොඩ නැගිය හැකි ය. එහෙත් වෙනත් අයගේ ජීවිත ආකා ර අනුව ජීවිත් විය නොහැකි ය. තමාට පැහැදිලිව බලන්න. තමා උත්සාහ කරමින් ලබා ගත යුතු දේ මොනවා ද යනුවෙන් පැහැදිලි කර ගන්න. තමාගේ අනාගතය තීරණය කරන්නේ  වෙනත් අයගේ අදහ-ස් හා ක්‍රියාවන් අනුව නොව තමා ක්‍රියා කරන ආකා රය මත ය.

# මනස්කාන්ත
# ෂින් අන් ච්‍යං ගංගාව

ශ්‍රීන් අන් ච්‍යං ගංගාව නැගෙනහිර චීනයේ ලස්සනම ගංගාවයි. සමස්ත දිග කිලෝමීටර් 373ක් වන මෙම ගංගාවට ආශ්‍රිත ප්‍රදේශ ප්‍රමාණය වර්ග කිලෝමීටර් 11000කි. මෙම ගංගාව ආරම්භ වන්නේ චීනයේ ප්‍රසිද්ධ කඳු හතරෙන් එක වන හුවාන් ශැන් කන්දෙන්.

චීන අන් හුයි හා ජච්‍යං පළාතේ එම ගඟ ගලා බසිනවා. පොහෝසත් ජල සම්පත් පමණක් නොව මෙම ගංගාවේ දෙපස ඉතා ප්‍රසිද්ධ නිර්මාණශිලිත් අන් හුයි ලක්ෂණ සහිත පැරණි ග්‍රාමීයේ නිවාස පිහිටා තිබේනවා. ජාතික දර්ශනීය කලාපය ලෙස ෂින් අන් ච්‍යං ගංගා ප්‍රදේශය ඉපැරණි කාලයේ සිටම චීන සාම්ප්‍රදායික දර්ශන සිතුවම්වල විචිත්‍රවය ඉස්මතු කරනවා.

පසුගිය ශත වර්ෂයේ ෂින් අන් ච්‍යං ගඟ දැඩි ජල දූෂණය හේතුවෙන් මුළු ගංගා ජල පද්ධිය දරුණු බලපෑමට ලක් වුණා. ජච්‍යං පළාතේ චියැන් ඩෞව් වැවේ ජල සැපයුම් ප්‍රධාන ගංගාව ෂින් අන් ච්‍යං



ගංගාව යි. ඒ කාලයේ එම වැවේ ජෛව සමබරතාව සියල්ලම විනාශ වුණා. මෙම ගැටළුව විසඳා ගැනීම වෙනුවෙන් ජල පද්ධතිය සුරක්ෂිත කිරීමේ අන්තර් පළාත් සහය වැඩසටහනක් 2011 වසරේ සිට 2014 වසර දක්වා ක්‍රියාක්මක වුණා. හැම වසරක ම චීන යුවාන් මිලියන 300කින් යුත් ජාතික අයවැය මුදල් ඊට වෙන් කිරීමට චීන රජය තිර්ණාය කළා.

ෂින් අන් ච්‍යං ගඟේ පරිසර සුරක්ෂික කිරීම සඳහා ප්‍රධාන වැඩකටයුතු කිහිපයක් ක්‍රියාත්මක කළ යුතුය. මුළින් ම ගංගා දෙපස ග්‍රාමීය ප්‍රදේශයේ පරිසර පාලනය ශක්තිමත් කළ යුතු යි. දූෂිත ජලය පාලනය කිරීම පමණක් නොව ගමේ සියළු පරිසර සුරක්ෂිත කටයුතු ද ක්‍රියත්මක කෙරුණා. ඒ ඒ ගමේ ගෘහස්ථ දූෂිත ජලය හා දෛනික අපද්‍රව්‍ය විද්‍යාත්මක පාලන සුදුසු ක්‍රම රජය විසින් ලබා දී තිබෙනවා. දිනෙන් දිනම ග්‍රාමීය ජනතාවගේ පරිසර සුරක්ෂිතභාවය පිළිබද අවබෝධ වඩා වැඩි දියුණු වුණා.

ෂින් අන් ච්‍යං ගංගාවේ මිරිදිය ධීවර සම්පත් ඉතා බහුලයි. හැබැයි  මිරිදිය ජලජ අභිජනනයේ යම් ජල දුෂණයක් ඇති වෙනවා. කොටුවලින් ජලජ අභිජනනය කිරීමේදී පොහොර,සත්ත්ව ආහාර හා රසායනික ද්‍රව්‍ය ජලයට මුදා හැරීම හේතුවෙන් ජල දූෂණයක් සිදු වෙනවා. මෙම තත්ත්වය යටතේ වඩා විද්‍යාත්මක ධීවර ක්‍රමය භාවිත කරමින් කොටුවේ ප්‍රමාණය අඩු විය යුතු බව පරිසර සුරක්ෂිත දෙපාර්තමෙන්තුව යෝජනා කර තිබෙනවා. චීන රජයේ සහය යටතේ ෂින් අන් ච්‍යං ගංගාවේ මාළු ඇති කිරීම භාවිත කළ කොටු 6188ක් ඉවත් කෙරුණා. ඊට සම්බන්ධ ධීවරයන් 30000 දෙනෙකුට මුදල් දීමනා ලබා දුන්නා.

පරිසරය යහපත් වෙමින් ෂින් අන් ච්‍යං ගංගාවේ ගංගාශ්‍රිත ප්‍රදේශ විවිධ නව කර්මාන්ත ස්ථාපිත කෙරුණා. ඒ අතරින් නව කෘෂිකාර්මය හා සංචාරක කර්මාන්තය ඉතා සාර්ථක වී තිබෙනවා.





සාම්ප්‍රදායික ග්‍රාමයේ පැරණි ග්‍රාමීය නිවාස දැනට ජනප්‍රිය දර්ශන ස්ථානයි. සංස්කෘතික සංචාරක මාර්ග වර්ධනය කිරීමට බොහෝ සංචාරක සමාගම් සූදානමින් සිටිනවා. අන් හුයි පළාතේ ග්‍රාමීය නිවාස ලක්ෂණ සහිත සංචාරක නිවාස සංකීර්ණ රැසක් ඉදි කෙරුණා. ඒ ප්‍රදේශයේ වගා කෙරෙන පැණි දොඩම් ඇතුළු පළතුරුවලට බොහෝ දෙස් විදෙස් සංචාරකයන් ඉතා කැමති නිසා විශේෂ උද්‍යාන රැසත් ඉදි කෙරුණා.සංචාරක කර්මාන්තය හා ගමේ සංවර්ධනය එකතු කරමින් එහි කෘෂිකාර්මයටත් නව වර්ධන යුගයක් උදා වී තිබෙනවා.

ඉදිරිපත් කිරීම : සුන් ජ්යා ජ්යා





# අසන්නන්ගේ බිත්ති පුවරුව

[illegible]

[illegible]

"පින් කළ සිතට දැනෙනව... ඔබ තුළිනා අපේ"

① ජෝන්-ලී, මුත්තියාස් සිය 'ඇදුරු' අ ඈ ත
'සාන් හොසේ' සිතින් අඛණ්ඩ ප්‍රවෘත්ති ඇසූ ස
මින් ඉදිරියට සිත සිඳ කමකින් දැ ඈ ත
රන් දින මතකි, කද-ගුවනින් සිය ද ඈ ත.

② සිංහල බසින් ඇල්ලුණු දී සිට සේවේ
මං, නෑ අසා මිස එ බස් එක නෑ වේ
ලං වුණු අප අමගෙ, කිසිව අ, රැ වේ
මංසලකුණු ය, ඔබ ලෙවකට ගෙනාවේ

③ පන් සංගතු මියව තුරුම සිටින මගේ
ඇත් දුනු 'රසවතා'! සිතියට සිගර ...
"සංචාරය" මගේ මගෙ,- අද-ඊයේ වගේ
පින් කළ සිතට දැනේය. ඔබ තුළගොනගේ

1975 ජනවාරි 01 දි සිට CRI සිංහල සේවය
සමග එක් සිටින - 1995 (පොතු 12) දි -
'වියදපත්' සම්මානය ලබා ගැනීම, සිංහල ...
CRI, ශ්‍රාවක මම-(W.5.) ධාලිල් ප්‍රනාන්දු
'සම්පත් ආරඹගේ' - මිනුවන්
දු. ක. අංකය 94 0777276898


Happy Wesak
Wishing you
a bright, beautiful
and prosperous
wesak
with each day
vibrant with
joy and happiness






May your Christmas
be wrapped in Joy
and filled with Love.
Best Wishes for
Peace, Health
and Happiness
throughout the coming year
Happy
Christmas
& Happy New Year
Lk. 2:12



# තෙල්වලින් බැදපු බෝංචි ව්‍යංජනය

ඉදිරිපත් කිරීම : වං යිං

## අවශ්‍ය ද්‍රව්‍ය

- බෝංචි ග්‍රෑම් 500ක්
- රතු පාට වියළි මිරිස් කරල් 8ක්
- ගම් මිරිස් සුදුසු ප්‍රමාණයක්
- සුදු ලූණු ගෙඩි භාගයක්
- ඉඟුරු කැබැල්ලක්
- ලුණු ස්වල්පයක්
- සීනි ස්වල්පයක්
- සෝයා සෝස් සුදුසු ප්‍රමාණයක්
- තෙල් සුදුසු ප්‍රමාණයක්





## සාදන ක්‍රමය

- බෝංචි අඟලක ප්‍රමාණයට කපා ගන්න.
- සුදු ලූණු හා ඉඟුරු ඉතා ම සිහින් ව කපා ගන්න. මෙම ප්‍රමාණය වැඩි වශයෙන් එක් කරන්නේ නම් වඩාත් රසවත් වෙයි.
- රතු පාට වියළි මිරිස් කරල් සෙන්ටිමීටරයක පමණ ප්‍රමාණයේ කැබලිවලට කපන්න.
- තෙල්, තාච්චියට දමා රත් කර, සූදානම් කර ගත් බෝංචි එම තාච්චියට දමන්න. බෝංචි හොඳින් තෙල්වල තැම්බුණු පසු එයින් පිටතට ගන්න.
- තාච්චියේ ඉතුරු වූ තෙල්වලට කලින් කපා ගත් සුදු ලූණු හා ඉඟුරු කැබලි, වියළි මිරිස් කැබලි හා ගම් මිරිස් දමන්න. ඒවා හොඳින් රත් වී ගෙන එන විට බෝංචි ටික යොදා ගන්න.
- ඉන් පසු ක්ෂණිකව සෝයා සොස්, ලුණු හා සීනි දමා ගෙන, නිම කර ගත් මෙම රසවත් බෝංචි ව්‍යංජනය ලිපෙන් බා ගන්න.

# ඇස් දෙක ලස්සණට තබා ගමු



ඉදිරිපත් කිරීම : ශී යුයැ

ඕනෑ ම කෙනෙකුගේ ශරීරයේ වැදගත් ම අංග අතර ඇස් දෙකට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයක්. නිරෝගී ඇස් දෙකක් හිමි වීමට නම් ඔබ ඊට පිළියම් කළ යුතුයි. ඒ සඳහා මූළිකව විටමින් ඒ සහිත ආහාර ගැනීම වැදගත්. එසේම නින්ද වැදගත්. නිදි වැරීම, දැඩි හිරු රශ්මියට දෑස් නිරාවරණය වීම, දූවිලි අංශු ඇතුල් වීම ආදී කාරනා නිසා දෙඇස් දුර්වර්ණ වී දුර්වල විය හැකියි. ඒ සඳහා දිනකට වතුර වීදුරු අටක් පානය කිරීම ද වැදගත්. දෙඇස් වලට ඇති වී ඇති විඩාබර ගතිය දුරුකර ගැනීමට ඔබට අවශ්‍ය නම් එය මෙසේ කළ හැකියි.

මේසයක් මත ඔබේ වැලමිට තබා ගෙන අත්ල දෑස්වලට ඉහළින් තබාගන්න. අත්ලේ කෙළවර කම්මුල්වල ස්පර්ශ වන සේ තබා ගෙන ඔබගේ හිස පහතට ගෙන එන්න ඒ ආකාරයෙන් කරන විට ඔබගේ හිසෙහි බර ඔබගේ අත්ල මතට යොමු කිරීමට වගබලා ගන්න. මේ වන විට ඔබගේ බෙල්ලේ මාංශ පේශීන් පහසු තත්තවයට පත් වෙනවා. මේ ආකාරයෙන් විනාඩි 10ක් පමණ සිටීම හොඳයි. එයට අමතරව තවත් ව්‍යායාමයක් තිබෙනවා. ඔබගේ අත්ලෙ පහළම කොටස ඔබගේ වැසුණු දෑස් මත සෙමින් හා පිරිපුන් ලෙස තද කරන්න. දෙඇස් සම්පූර්ණයෙන් ඇඳුරු වනතුරු මෙම ක්‍රමය යළි යළිත් කරන්න.





ඔබේ දෙඇස් දීප්තිමත්ව තබා ගැනීමට අවශ්‍ය නම් මෙසේ කරන්න. පිපිඥ්ඥා ගෙඩියකින් භාගයක මද ගෙන මිරිකා ගන්න. මෙම යුෂ ශීතකරණයක තබා සිසිල් කොට පිරිසිදු කපු පුළුන් රෙදි කැබලි රෝසවතුරින් හා ශීත කළ පිපිඥ්ඥා යුෂින් පොඟවා ඇඳක දිගා වී දෙඇස් මත තබා ගෙන විනාඩි 5ත් 10ත් අතර කාලයක් ඉන්න. මෙම ක්‍රමය දිනකට දෙවරක් කළ හැකි නම් සාර්ථකයි. එසේම තේ කහට ගෙන එය නිවුනාට පසු පිරිසිදු කපු පුළුන් කැබලි දෙකක් ගෙන පෙර පරිදිම ඇඳක දිගා වී දෙඇස් මත තබා විනාඩි 5ත් 10ත් අතර කාලයක් ඉන්න. ඇස් වටා කළු පැහැ වී ඇත්නම් මින්චි කොළ කොටා ඇස් වටේට ආලේප කර පසුව සෝදා හරින්න. මේ සඳහා ක්‍රීම් වර්ග භාවිත කළ හැකි අතර එය රාත්‍රී නින්දට යාමට පෙර ආලේප කරන්න.





SRI LANKA RED CROSS SOCIETY

# පසුගියදා ඇතිවූ ආපදා තත්වයේදී ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ මානුෂීය මෙහෙවර

පසුගිය මාසයේ ශ්‍රී ලංකාවට බලපෑ අධික වර්ෂාව හේතුවෙන් ඇතිවූ ගංවතුර සහ නායයෑම් හේතුවෙන් බෝහෝ දිස්ත්‍රික්ක වල ජනතාව මහත් පීඩාවට පත්විය. මෙම අවස්ථාවේ විපතට පත් ලක්ෂ සංඛ්‍යාත ජනතාවට සහන සැලසීම සදහා ශ්‍රී ලංකා රතු කුරුස සමාජයද පෙරමුණ ගන්නා ලදි.

කොළඹ, ගම්පහ, පුත්තලම , කුරුණෑගල, රත්නපුර කිලිනොච්චි සහ මහනුවර දිස්ත්‍රික්ක වල ප්‍රදේශ රාශියක් ගංවතුර තර්ජනයට මුහුණ දීමට සිදුවිය. මෙහිදි ශ්‍රී ලංකා රතු කුරුස සමාජ ශාඛාවන්හි ස්වේඡ්චා සාමාජිකයින් පීඩාවට පත් පිරිසට සහන සේවා සැපයීමට ඉදිරිපත් විය. විශේෂයෙන් වඩාත් පීඩාවට පත් ප්‍රදේශ වල කදවුරු වල ජනතාව වෙත ප්‍රථමාධාර පහසුකම් ලබාදීම, වියළි ආහාර , පිසූ ආහාර, සනීපාරක්ෂක කටයුතු, ජනතාව ආරක්ෂිතව මුදවා ගැනීම් කටයුතු වලට සහය දැක්වීම, නිවාස සහ ගොඩනැගිලි පිරිසිදු කිරීමට දායක වීම හා ළිං පිරිසිදු කිරීම් ආදිය සිදු කරන ලදි.

එසේම නායයෑම් හේතුවෙන් පීඩාවට පත් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක සහ බුලත්කොහුපිටිය යන ප්‍රදේශවල අවතැන් වු ජනතාව වෙසෙන කඳවුරු වෙත වියළි සහ පිසූ ආහාර ලබා දීම, ප්‍රථමාධාර සහ සනීපාරක්ෂක පහසුකම් සැලසීම, ආදියද සිදු කරන ලදි.

විශේෂයෙන්ම අරණායක සාමසර කන්ද නායයෑමේදි ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ක්ෂණිකව ක්‍රියාතමක වෙමින් නායයෑමට හසුවු පිරිස් බේරාගැනීම සහ ඔවුන් සදහා ප්‍රථමාධාර ලබා දීමට ඉදිරිපත් විය. පසුව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ එක්ව විපත පත්වු පුද්ගලයන් ආරක්ෂිත ස්ථානවෙත කැදවාගෙන ගොස් ආරක්ෂිත කදවුරු වල ස්ථානගත කිරීමට කටයුතු කරන ලදි. මෙහිදි විපතට පත් ජනතාව වෙත ඇදුම් පැලදුම් ආදී මූලික අවශ්‍යතා සැපයීම සෞඛ්‍ය සායන පැවැත්වීම ප්‍රධාන වශයෙන් ඉටු කරන ලදි. අද වන විට විපතට පත් ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය සහ කදවුරු කළමණාකරනය ශ්‍රී ලංකා රතු කුරුස සමාජය මගින් ඉටුකරනු ලබයි.

මෙම සහන සේවා සැපයීමේදී ආපදා කලමනාකරන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දැක්වු සහයෝගයට අපගේ ස්තූතිය පිරිනමමු.























| | Frequency | Time (Sri Lanka) | |
|---|---|---|---|
| FM | CRI - Sri Lanka FM97.9 | 05.00-10.00 (Eng) | 10.00-00.00 (Sin) |
| Short wave | 7260/9490/7265/11900 | 19:30-20:30 | 05:00-06:00 |
| Online | http://sinhalese.cri.cn/ | | |

# චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය

ශ්‍රී ලංකා ජන ජීවිතය මැනවින් හඳුනාගත් සුහද මිතුරෙකු ලෙස චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ඉදිරි ගමනක් ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව පුරා විසුරුවා හැරෙන කෙටි තරංග සහ බස්නාහිර පළාත ආවරණය කරන FM තරංග විකාශනයක් සිංහල සේවය සතුවෙයි. සියළු වැඩසටහන්වලට පොඩ්කාස්ටින් සේවාව ඔස්සේද සවන් දිය හැකිය.

සිංහල සේවය ආරම්භ වූයේ වසර 1975 ජනවාරි පළමු දාය. එවක පැවැතියේ කෙටි තරංග විකාශනයක් පමණි. වසර 2010 අප්‍රේල් 23 වනදා එහි FM තරංග විකාශනය ආරම්භ කෙරිණ.

මේ වන විට චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවය ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හා පුවත්පත් සමඟ මනා සහයෝගික සම්බන්ධතාවකින් යුක්තව ඉදිරියට ගමන් කරමින් සිටී.

චීන ජාත්‍යන්තර ගුවන් විදුලියේ සිංහල සේවයේ වැඩසටහන් ශ්‍රී ලංකාවේ සමස්ත පවුල් ඒකකය ඉලක්ක කොට විසුරුවා හරිනු ලැබේ. වැඩසටහන් අන්තර්ගතය චීනය සහ ශ්‍රී ලංකාව අතර ඇති සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ රාජ්‍යතාන්ත්‍රික බැඳීම පදනම් කොට සකස් කර තිබේ. සතියේ දින පහ තුළ, ආර්ථිකය, සංස්කෘතිය, ජන ජීවිතය සහ මිත්‍රත්වය, සංචාරය, සූප කලාව, චීනයේ භාෂා අධ්‍යයනය වැනි විෂය ක්ෂේත්‍ර ඔස්සේ වැඩසටහන් විකාශනය කෙරේ. විචිත්‍රාංග සමාජ හා කාලීන තොරතුරු සඳහා ද විශේෂත්වයක් හිමිව තිබේ. චීනයේ ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ නැවුම් තොරතුරු රැගත් ප්‍රවෘත්ති විකාශනයක්ද දිනපතා සිදුකෙරේ.

中 国 国 际 广 播 电 台
CHINA RADIO INTERNATIONAL


**SINHALA SERVICE**
**CHINA RADIO INTERNATIONAL**

No.16A, Shijingshan Road,
Beijing, P.R. China
Post code:100040
Tel: 00 86 10 6889 2373/0439
Fax: 00 86 10 68892361
Email: sinhalacri@gmail.com
Web: http://sinhalese.cri.cn/
Facebook: Cheena Sinhala handa
Twitter: Voice of China-Lanka